## යෝජිත පළාත් පාලන සහ පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීම පිළිබඳ මතු වී ඇති අවිනිශ්චිත බව සමනය කිරීමට රජය වහා පියවර ගත යුතුව ඇත

නිසි කලට, නිසි අයුරින් මැතිවරණ පැවැත්වීම ඉතා උසස් ප්‍රජාතන්ත්‍රවාදී භාවිතාවකි. එමෙන්ම ඊට අවැසි පුරවැසි දායකත්වය තහවුරු කිරීම මෙන්ම නිදහස් හා සාධාරණ වටපිටාවක් නිර්මාණය කිරීම කවර රජයක හෝ අත්හැරිය නොහැකි වගකීමකි. මෙරටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති ජනතා පරමාධිපත්‍යය නිවැරදි ලෙස අර්ථගැන්විය හැක්කේ එලෙස ක්‍රියා කිරීම තුළින් පමණක් බව අවධාරණය කළ යුතුය. කරුණු එසේ වුවද අද වන විට වර්තමානයේ මැතිවරණ පැවැත්වීම සම්බන්ධයෙන් උද්ගතව ඇති අවිනිශ්චිතබව පිළිබඳ මෙරටේ ක්‍රියාකාරී සියලු මැතිවරණ නිරීක්ෂණ සංවිධාන තම බලවත් කණස්සල්ල පළ කර සිටී.

පළාත් පාලන ඡන්ද විමසීම - නව මැතිවරණ ක්‍රමයක් යටතේ වැඩි කාන්තා නියෝජනයක් සහිතව පළාත් පාලන ඡන්ද විමසීම පවත්වා ප්‍රජාවට වඩාත් සමීප ජනතා නියෝජිත ආයතන නව ජවයකින් ක්‍රියාත්මක වේ යැයි මෙරටේ පුරවැසියන් තුළ ඇත්තේ ඉතා සුපසන් ආකල්පයකි. එහෙත් ඊට අදාළ තාක්ෂණික ගැටළු උපයෝගී කර ගනිමින් පෙර හා වර්තමාන පාලන තන්ත්‍ර දෙක ම මෙකී ඡන්ද විමසීම පැවැත්වීම දිනෙන් දින කල් දමන ලදි. මේ වන විට මෙකී ඡන්ද විමසීම පැවැත්වීම සඳහා ගත යුතුව ඇත්තේ තවත් එක් ක්‍රියා මාර්ගයක් පමණි . එනම් දැනටමත් පාර්ලිමේන්තුවේ සභාගතකර ඇති සංශෝධන පනත් කෙටුම්පත සම්මත කිරීමයි. එහි වගකීම ඇත්තේ දේශපාලන පක්ෂ නායකයන් ප්‍රමුඛ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සතුවය.

මෙම මැතිවරණ ක්‍රමය පිළිබඳ සංවාදය අරඹන ලද්දේ මීට වසර කිහිපයකට පෙරය . ඒ සඳහා දැනටමත් වැය කර ඇති ජාතික ධනය අප්‍රමාණය. ජනතා නියෝජිතයන් රහිතව යම්තාක් දුරකට අක්‍රිය වී ඇති මෙරටේ පළාත් පාලන ආයතන පද්ධතිය නිසා මතු වී ඇති අර්බුධ ප්‍රමාණය ද නිමක් නැත. මෙකී සියලු කරුණු පසෙක තිබිය දී, පළාත් පාලන ඡන්ද විමසීම පැවැත්වීමට ක්‍රියා නොකිරීම සැබෑ ජනතා අභිලාශ, චේතනාන්විතව හා සැළසුම්සහගතව මර්ධනය කිරීමක් බව සියලු මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල ඒකමතික අදහසයි. එය ඍජුව මෙරටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති ජනතා පරමාධිපත්‍ය අභිමි කරන්නකි. තවද පොදුවේ මෙරටේ සංවර්ධන ක්‍රියාදාමය ඉතා බරපතල අවදානමකට ද ලක් කරන්නකි.

පළාත් සභා ඡන්ද විමසීම : උතුරු මැද, නැගෙනහිර හා සබරගමුව යන පළාත් සභා තුනෙහි නිල කාල සීමාව ඉකුත් වීමට තවත් ඇත්තේ සති කිහිපයකි. ඒ අනුව ඊට අදාළ නාම යෝජනා කැඳවීම

එළඹෙන ඔක්තෝබර් මස පළමු සතියේ සිදු කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ අපේක්ෂාවයි .ඒ අතරතුර කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරමින් රජය මූලික කරුණු 3ක් දක්වා ඇත .පළාත් පාලන ඡන්ද ක්‍රමයට සමගාමීව පළාත් සභා ඡන්ද ක්‍රමය සංශෝධනය කිරීම, නාම යෝජනා ලබා දීමේදී කාන්තා නියෝජනය 30% ක් දක්වා වර්ධනය කිරීම සහ සියලු පළාත් සභා ඡන්ද විමසීම් එකම දිනක පැවැත්වීම එකී මූලික කාරණාය.මෙකී කරුණු ත්‍රිත්වය මෙරටේ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන අපේක්ෂා කරන ලද හා යෝජනා කොට ක්‍රියාවට නගන ලෙස සෑම රජයකට ම දිගු කලක් තිස්සේ බල කරන ලද ඒවාය . වඩාත් ජනහිතකාමී අර්ථවත් පළාත් සභාවක් නිර්මාණය කර ගැනීම සඳහා මෙකී යෝජනා වඩාත් හිතකර වේ. ඒ අනුව මේ සඳහා අනලස්ව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් වර්තමාන රජයට සියලු මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල ප්‍රශංසාව හිමි වේ. එලෙස රජයට ප්‍රණාමය දක්වන අතර ම අවධාරණය කළ යුතු කරුණක් ඇත. එනම් මෙවැනි යෝජනා ගෙන ආ යුත්තේ මෙලෙස ඉතා කඩිමුඩියේ කෙටි දැනුම් දීමක් තුළ හදිසියේ ක්‍රියා කිරීමෙන් නොවන බවයි. පළාත් පාලන ඡන්ද විමසීම දිනෙන් දින කල් යෑමෙන් වඩාත් විපිලසර වී ඇති ඡන්දදායකයා මෙකී යෝජනා දෙස බලන්නේ ද සැක සංකා මුසු ආකල්පයකින් බව රජය වටහා ගත යුතුව ඇත. ඉහත යෝජනා ත්‍රිත්වයෙන් එකක් වන සියලු පළාත් සභා ඡන්ද විමසීම් එකම දිනක් තුළ පැවැත්වීම බැලූ බැල්මට ඉතා ප්‍රගතිශීලී පියවරකි. ඉන් ජාතික ධනය යම් ප්‍රමාණයක් ඉතිරි විය හැකි අතර පළාත් සභා එකක් හෝ කිහිපයක් වෙත පමණක් තම සියලු බලය හා වැර යොදමින්, මහජන සම්පත් ඇති අතිදැවැන්ත ලෙස අවභාවිත කිරීමේ දේශපාලන ප්‍රයෝගයද මින් වලක්වා ගැනීමේ හැකියාව පවතී. එහෙත් එවැන්නක් තීරණය කළ යුත්තේ ඉදිරියේදී පුළුල්ව පවත්වන මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම සඳහා වන විධිමත් සාකච්ඡා මාලාවකිනි. මෙවැන්නක් ඉතා හදිසියේ ක්‍රියාවට නගන්නේ නම් පළාත් සභා මැතිවරණයක් නැවත පැවැත්වීමක් පිළිබඳව මෙරටේ ඡන්දදායකයන්ට අපේක්ෂා කල හැක්කේ ඌවා පළාත් සභාව විසුරුවා හැරීමට නියමිත දිනටය. එනම් වසර 2019 ඔක්තෝබර් මස 08 වන දිනට ය. ඒ අනුව රජය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව නිසා අගතියක් සිදුවන්නේ ඡන්දදායකයාට ය. ඒ පරමාධිපත්‍යය බලය අභ්‍යාස කිරීමට ලැබෙන අවස්ථාව තවත් වසර කිහිපයකින් කල් යන නිසාය.

එකම දිනක මැතිවරණය පැවැත්වීමට රජය අවංකව කල්පනා කරන්නේ නම් කළ යුතු වන්නේ මුලින්ම නිල කාලය අවසන් වීමට නියමිත පළාත් සභාවට සමගාමීව සියලු පළාත් සභා විසුරුවා හැර එකම දිනක මැතිවරණය පැවැත්වීමයි. නොඑසේ නම් ඉදිරි පළාත් සභා මැතිවරණ එලෙසම පවත්වා මැතිවරණ නීතිය හා ක්‍රමය විධිමත් සාකච්ඡාවකට බඳුන් කිරීමෙන් පසු ඉදිරියේදී පැවැත්වීමට නියමිත මැතිවරණ නිශ්චිත කාල සටහනක් අනුව එකම දිනයකදී පැවැත්වීමට කටයුතු කිරීමයි.

මෙරටේ මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කළ යුතු යැයි මැතිවරණ නිරීක්ෂණ සංවිධාන අවධාරණය කරන ලද්දේ අද ඊයේ නොවේ. තවද එලෙස ඉදිරිපත් කරන ලද එකම යෝජනාව ද පළාත් සභා ඡන්ද විමසීම එකම දිනක පැවැත්විය යුතුය යන යෝජනාව පමණක් නොවේ. ඒ අනුව මෙම යෝජනාව මෙරටේ නිරීක්ෂණ සංවිධාන මගින් ද ඉදිරිපත් කරන ලද එකක් යැයි හුවා දක්වමින් රජයේ සමහර පාර්ශව කරුණු දැක්වීම බලවත් කණස්සල්ලට හේතුවකි.

කවර අර්බුධකාරී වාතාවරණයක දිවි ගෙවූවද මෙරටේ ජනතාව තුළ මැතිවරණ කෙරෙහි ඇත්තේ බලවත් විශ්වාසයකි . ඉතා පුළුල් නියෝජනයක් සහිත ව්‍යවස්ථාදායක සභාවක් සඳහා වසර 1947 දී පවත්වන ලද මහා මැතිවරණයේ පටන් අද දක්වා ම මෙරටේ පාලන තන්ත්‍ර වෙනස් වී ඇත්තේ

ප්‍රජාතන්ත්‍රවාදීව පවත්වන ලද මැතිවරණ හරහාය. යම් යම් තාක්ෂණික කරුණු ඉස්මතු කරමින් නිල වශයෙන් පැවැත්විය යුතු මැතිවරණ තව තවත් කල් දැමීමට ක්‍රියා කිරීම තම පටු දේශපාලන අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනීමට හේතු විය හැකි වුවද එය කිසිසේත්ම මෙරටේ පුරවැසි අපේක්ෂාවන් සපුරාලන්නක් නොවන බව තරයේ අවධාරණය කළ යුතුය. තවද එය දේශීයව මෙන්ම ජාත්‍යන්තරව ද රටක් ලෙස සාමූහික ප්‍රගතිය උදෙසා එකඟ වී ඇති නීති, සම්ප්‍රදායන් හා ගිවිසුම් ද උල්ලංඝනය කරන්නකි.

රජයක් යනු තම පුරවැසි අපේක්ෂා ඉටු කිරීමේ අභිලාෂයෙන් යම් කාල සීමාවක් සඳහා මහජන කැමැත්තෙන් පත්ව ඇති භාරකරුවෙක් විනා, රටවැසියා නිරායාසයෙන් හිමිකම් කියන අයිතිවාසිකම් පැහැර ගන්නා අත්තනෝමතික බවින් ක්‍රියා කරන්නෙක් නොවන බව නැවතත් රජයට සිහි කරන අතර නිසි කල, නිසි ලෙස මැතිවරණ පවත්වා, මෙරටේ පුරවැසියන් සතු හිමිකම් ආරක්ෂා කිරීමට වගකීමෙන් කටයුතු කරන ලෙස තරයේ ඉල්ලා සිටින්නෙමු.

**සියලු නිරීක්ෂණ සංවිධාන වෙනුවෙන් :**

**රෝහණ හෙට්ටිආරච්චි** - නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (PAFFREL)
**මංජුල ගජනායක** - මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)
**කීර්ති තෙන්නකෝන්** - නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය (CAFFE)
**මනෝරි කලුගම්පිටිය** - නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා ජනතා ව්‍යාපාරය (MFFE)
**අශෝක ඔබේසේකර** - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TISL)
**දයා හේරත්** - ලක්බිමේ මව්වරු සහ දියණියෝ (MDL)